# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත

**[සහතිකය සටහන් කළේ 2023 ජුනි මස 27 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

2023 ජුනි මස 30 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 54.00 තැපැල් ගාස්තුව **:** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත

[සහතිකය සටහන් කළේ 2023 ජුනි මස 27 වන දින]

එල්.ඩී–ඕ. 2/2023

**පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පිහිටුවීම සඳහා ද; පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය නිශ්චිතව දැක්වීම සඳහා ද සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලසීම පිණිස ද වූ පනතකි.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාව යටතේ, සහ විශේෂයෙන්ම, අයවැයෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති හෙයින් ද: පූර්විකාව

තිරසර මූල්‍ය තත්ත්වයක් පවත්වාගෙන යාම, රාජ්‍ය සම්පත් ඵලදායී ආකාරයට වෙන් කිරීම සහ රාජ්‍ය භාණ්ඩ හා සේවා කාර්යක්ෂමව බෙදාහැරීම තහවුරු කිරීම සම්බන්ධව වගකිව යුතු තීරණ ගැනීමට පාර්ලිමේන්තුව සඳහා අත්‍යවශ්‍ය යැයි සැලකෙන හෙයින් ද:

පාර්ලිමේන්තු මූල්‍ය විනිවිදභාවය සඳහා සිදුකරනු ලබන පුළුල් කැපවීමේ කොටසක් වශයෙන්, සාධනීය තීරණ ගැනීමෙහි ලා අදාළ තොරතුරු, ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවල සහ යෝජනාවල ඇතුළත් විය යුතු බව පිළිගන්නා හෙයින් ද:

පාර්ලිමේන්තු සාකච්ඡා සහ එහි රාජ්‍ය මූල්‍ය වගකීම් සාධනීයව ක්‍රියාත්මක කිරීම සඳහා එය සමාලෝචනය කරනු ලබන යෝජනා ස්වාධීන විශ්ලේෂණය කිරීමකට ප්‍රවේශ වීම මගින් සහාය වන බව පිළිගෙන ඇති හෙයින් ද:

පිළිගත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල ප්‍රතිපත්ති ප්‍රකාශනයන්හී ඇති ප්‍රතිපත්ති සම්බන්ධව නිදහස් හා පක්ෂග්‍රාහී නොවන පිරිවැයකරණය විශ්ලේෂණ ඉදිරිපත් කිරීම වඩා විනිවිදභාවයෙන් යුත් සහ දැරිය හැකි රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා මග පෙන්විය හැකි බව පිළිගන්නා හෙයින් ද:

වියදම් යෝජනා පිරික්සීමේ දී සහ රාජ්‍ය මූල්‍ය තීරණ ගැනීමේ දී, විශ්වාසය තැබිය හැකි, අයවැය විශ්ලේෂණයන් සහ පිරිවැයකරණ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සහ පිළිගත් දේශපාලන

පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වෙත ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල පිරිවැයකරණ විශ්ලේෂණ ඉදිරිපත් කිරීමට ස්වාධීන ආයතනයක් පිහිටුවීමට අවශ්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

**පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පිහිටුවීම සහ එහි කාර්යභාරය**

පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පිහිටුවීම

**2.** (1) පාර්ලිමේන්තු අයවැය කාර්යාලය යනුවෙන් හඳුන්වනු ලබන ස්වාධීන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) පාර්ලිමේන්තු අයවැය කාර්යාලය-

(අ) අවිච්ඡින්න පැවැත්මක් සහිත සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු ය;

(ආ) පොදු මුද්‍රාවක් තිබිය යුතු ය;

(ඇ) එකී නාමයෙන් එය විසින් සහ ඊට එරෙහිව නඩු පවරනු ලැබිය හැකි ය; සහ

(ඈ) යම් චංචල හෝ නිශ්චල දේපළක් සන්තකව තබා ගැනීම, අත්කර ගැනීම සහ බැහැර කිරීම කරනු ලැබිය හැකි ය.

(3) පාර්ලිමේන්තු අයවැය කාර්යාලය ස්වාධීන ආයතනයක් විය යුතු අතර පාර්ලිමේන්තුව වෙත වගකිව යුතු ය.

(4) පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ ස්වාධීනත්වයට සෑම අවස්ථාවකදී ම ගරු කළ යුතු ය.

(5) කිසිදු තැනැත්තකු විසින් පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ මෙහෙයුම් කටයුතු සහ පරිපාලනය සම්බන්ධයෙන් අනිසි බලපෑම් හෝ මැදිහත් වීම් සිදු නොකළ යුතු ය.

පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ අරමුණු

**3.** මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි ප්‍රතිපත්ති යෝජනාවල මූල්‍යමය, ආදායම් සහ වියදම් පිළිබඳ දෘෂ්ටියකින් අයවැය සම්බන්ධව ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන විශ්ලේෂණයක්, මධ්‍යකාලීන ආර්ථික සහ මූල්‍ය දැක්මක් සහ යෝජනාවන්හි පිරිවැය ඇගයුම් සැපයීම හරහා-

(අ) පාර්ලිමේන්තුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්වකීය රාජ්‍ය මූල්‍ය වගකීම් ඉටු කිරීමෙහිලා සහාය වීම; සහ

(ආ) යම් පිළිගත් දේශපාලන පක්ෂයකට සහ යම් ස්වාධීන කණ්ඩායමකට සහාය වීම,

පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ අරමුණු විය යුතු ය.

අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම

**4.** මේ පනතේ විධිවිධානවලට යටත්ව, පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින්-

(අ) අයවැය යෝජනා, ආර්ථික සහ මූල්‍ය පුරෝකථන සහ ප්‍රක්ෂේපණ සහ යෝජිත ප්‍රතිපත්ති සහ පනත් කෙටුම්පත් පිරිවැයකරණය ඇතුළුව රාජ්‍ය මූල්‍ය සම්බන්ධ කාරණාවල දී යම් කාරක සභාවකට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට;

(ආ) මැතිවරණයකට පෙරාතුව ම වූ කාලසීමාවක ස්වකීය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇති යම් යෝජනාවක් පිරිවැය කිරීම සඳහා පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට; සහ

(ඇ) සාමාන්‍යයෙන්, පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ අරමුණු සඳහා අවශ්‍ය හෝ සාධනීය කාරණා පිළිබඳ විශ්ලේෂණ සහ ලුහුඬු සටහන් සැපයීම මගින් පාර්ලිමේන්තුවට,

විශ්ලේෂී සහාය ලබා දිය යුතු ය.

## II වන කොටස

## පාර්ලිමේන්තු අයවැය නිලධරයා, නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා, උපදේශන කමිටුව සහ පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ කාර්ය මණ්ඩලය පත් කිරීම

පාර්ලිමේන්තු අයවැය නිලධරයා පත්කිරීම

**5.** මේ කොටසේ විධිවිධානයන්ට යටත්ව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු අයවැය නිලධරයා පත් කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තු අයවැය නිලධරයා, පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරයට ඉල්ලුම් කිරීමට සුදුසුකම් නිර්ණායක

**6**. පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරයට ඉල්ලුම් කරන තැනැත්තා-

(අ) දක්ෂ, අවංක, උසස් සදාචාරාත්මක ගුණභාවයක් සහ කීර්ති නාමයක් සහිත විය යුතු ය; සහ

(ආ) රජයේ අයවැයකරණය, මුදල් ප්‍රතිපත්තිය, මූල්‍ය ප්‍රතිපත්තිය හෝ ක්ෂුද්‍ර ආර්ථික විශ්ලේෂණ සම්බන්ධයෙන් අවම වශයෙන් අවුරුදු පහළොවක පළපුරුද්දක් තිබිය යුතු ය.

පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුර කාලය

**7.** පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුර කාලය, එකී ධුරයට පත් කරන ලද දින සිට අවුරුදු පහක් විය යුතු ය.

නැවත පත් කිරීම සඳහා පාර්ලිමේන්තු අයවැය නිලධරයාට ඇති සුදුසුකම

**8.** (1) පාර්ලිමේන්තු අයවැය නිලධරයා වශයෙන් පත් කරනු ලබන තැනැත්තා, මේ කොටස යටතේ ධුරයෙන් ඉවත් කරනු නොලැබුවේ නම් මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් කරනු ලබන නිර්දේශය මත, තවදුරටත් එක් ධුර කාලයකට වඩා නොවැඩි කාලසීමාවක් සඳහා නැවත පත් කිරීම සඳහා සලකා බැලීමට සුදුස්සකු විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් නැවත පත් කිරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් සිදු කරනු ලැබිය යුතු ය.

නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා පත්කිරීම

**9.** මේ කොටසේ විධිවිධානයන්ට යටත්ව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා පත් කරනු ලැබිය යුතු ය. නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටුකිරීමේ දී සහ කිරීමේ දී සහාය විය යුතු ය.

නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරයට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් නිර්ණායක

**10.** නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරයට ඉල්ලුම් කරන තැනැත්තා-

(අ) දක්ෂ, අවංක, උසස් සදාචාරාත්මක ගුණභාවයක් සහ කීර්තිනාමයක් සහිත විය යුතු ය; සහ

(ආ) රජයේ අයවැයකරණය, මුදල් ප්‍රතිපත්තිය, මූල්‍ය ප්‍රතිපත්තිය හෝ ක්ෂුද්‍ර ආර්ථික විශ්ලේෂණ සම්බන්ධයෙන් අවම වශයෙන් අවුරුදු දහයක පළපුරුද්දක් තිබිය යුතු ය.

නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුර කාලය

**11.** නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුර කාලය, එකී තනතුරට පත් කරන ලද දින සිට අවුරුදු පහක් විය යුතු ය.

නැවත පත් කිරීම සඳහා නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාට ඇති සුදුසුකම

**12.** (1) නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා වශයෙන් පත් කරනු ලබන තැනැත්තා මේ කොටස යටතේ ධුරයෙන් ඉවත් කරනු නොලැබුවේ නම් මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් කරනු ලබන නිර්දේශය මත තවදුරටත් එක් ධුර කාලයකට නොවැඩි කාලසීමාවක් සඳහා නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා වශයෙන් නැවත පත් කිරීම සඳහා සලකා බැලීමට සුදුස්සකු විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් නැවත පත් කිරීමක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(3) නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ පත් කිරීම හෝ නැවත පත් කිරීම, පාර්ලිමේන්තු අයවැය නිලධරයා වශයෙන් ඔහු හෝ ඇය පත් කරනු ලැබීමට ඔහුගේ හෝ ඇයගේ සුදුසුකම් මත බලපෑමක් ඇති නොවිය යුතු ය.

විශ්‍රාම වැටුප් රහිත බව

**13.** පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරය සහ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරය සඳහා විශ්‍රාම වැටුප් ගෙවනු නොලැබිය යුතු ය.

පාර්ලිමේන්තු අයවැය නිලධරයා සහ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා තෝරා ගැනීම

**14.** (1) පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින්-

(අ) ගැසට් පත්‍රයේ;

(ආ) ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කර බෙදාහරිනු ලබන එක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පතක; සහ

(ඇ) පාර්ලිමේන්තු නිල වෙබ් අඩවියේ,

දැන්වීමක් පළ කරමින් පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරය සහ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවිය යුතු ය.

(2) පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින්, (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලුම්පත් කැඳවීමේ දී සහ දැන්වීම සකස් කිරීමේ දී 15 වන වගන්තියෙහි සඳහන් උපදේශන කමිටුව විමසිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් දැන්වීම මගින් පාර්ලිමේන්තු මහ ලේකම්වරයා වෙත ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම සඳහා අවම වශයෙන් දින තිහක කාලසීමාවක් නිශ්චිතව දැක්විය යුතු ය.

(4) (අ) පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් ඉල්ලුම් කරන ලද තැනැත්තාගේ ස්ත්‍රී පුරුෂභාවය, පුද්ගල පසුබිම් විවිධත්වය, පළපුරුද්ද සහ ප්‍රවීණතාව සම්බන්ධයෙන් නිසි සැලකිල්ලක් දක්වමින්, පාර්ලිමේන්තු අයවැය නිලධරයා සහ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා ලෙස පත් කරනු ලැබිය යුතු යැයි නිර්දේශිත තැනැත්තන්ගේ නම් ලැයිස්තුවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) එකී නම් ලැයිස්තුව ලැබීමෙන් පසු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්, ස්වකීය නිර්දේශය ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ජනාධිපතිවරයා විසින් එලෙස නිර්දේශ කරන ලද තැනැත්තන් පාර්ලිමේන්තු අයවැය නිලධරයා ධුරයට සහ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා ධුරයට පත් කිරීම සඳහා කටයුතු කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ (අ) වන ඡේදයේ සඳහන් නම් ලැයිස්තුවේ නිශ්චිතව දක්වා ඇති කිසිදු තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කරනු නොලබන අවස්ථාවක, පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින්-

(අ) 6 වන, 10 වන සහ 16 වන වගන්තිවලට යටත්ව, මේ වගන්තිය යටතේ පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරය හෝ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරය සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති තැනැත්තන් අතරින් වූ වෙනත් නම් ලැයිස්තුවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ඉදිරිපත් කිරීම; හෝ

(ආ) පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරය හෝ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරය සඳහා ඉල්ලුම් කර ඇති යම් තැනැත්තකු අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අවස්ථාවක, මේ වගන්තිය යටතේ නැවත ඉල්ලුම්පත් කැඳවීම,

කරනු ලැබිය යුතු ය.

**15.** (අ) පාර්ලිමේන්තු අයවැය නිලධරයා සහ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා තෝරා ගැනීමේ කාර්ය පටිපාටියේ දී පාර්ලිමේන්තු මහ ලේකම්වරයාට සහාය වීම සඳහා; සහ — උපදේශන කමිටුව

(ආ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව, එක් එක් මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තු අයවැය කාර්යාලය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේ දී පාර්ලිමේන්තු අයවැය නිලධරයා වෙත සහාය වීම සඳහා,

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා, ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායකවරයාගෙන් සමන්විත වන උපදේශන කමිටුවක් තිබිය යුතු ය.

**16.** යම් තැනැත්තකු- — ධුරයට පත් වීමට හෝ අඛණ්ඩව කටයුතු කිරීමට නුසුදුසු වීම

(අ) සිය පත්වීමේ දින හෝ සිය නිල කාලය තුළ සත්‍ය, විභව්‍ය හෝ ප්‍රත්‍යක්ෂව තිබෙන සම්බන්ධතා ගැටුමක් ඇත්නම්, එකී තැනැත්තා-

(i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා සභිකයකු හෝ ප්‍රාදේශීය සභා සභිකයකු වේ නම් හෝ ඒ බවට පත්වන්නේ නම්;

(ii) පිළිගත් දේශපාලන පක්ෂයක හෝ වෘත්තීය සමිතියක සාමාජිකයකු වශයෙන් දේශපාලන ධුරයක් දරන්නේ නම් හෝ පිළිගන්නකු වන්නේ නම්;

(iii) පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින් හෝ ඒ වෙනුවෙන් ඇතුළත් වන යම් ගිවිසුමක් යටතේ යම් අයිතීන් හෝ ප්‍රතිලාභ ඍජුව හෝ වක්‍රව දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම්; හෝ

(iv) සිය කාර්ය ඉටු කිරීමේ දී අගතිගාමී ලෙස බලපෑමක් විය හැකි යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතා සතු වන්නේ නම්,

සම්බන්ධතා ගැටුමක් පිළිබඳ අනුමාන කෙරෙනු ඇත;

(ආ) ශ්‍රී ලාංකික පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලාංකික පුරවැසියකු වීම අවසන් කරන්නේ නම්;

(ඇ) අයහපත් සෞඛ්‍ය තත්ත්වය, කායික හෝ මානසික දුර්වලතාවය හෝ වෙනත් එවැනි හේතූන් මත ස්ථිරව ස්වකීය කාර්යන් ඉටු කිරීමට නොහැකි තත්ත්වයකට පත්වන්නේ නම්;

(ඈ) වංචනික හෝ දූෂිත චරිතයක් පිළිබඳ හෝ පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ සම්බන්ධතා කෙරෙහි අගතිගාමී වන වරදකට වරදකරු වී ඇත්නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවනු ලබන බන්ධනාගාරගත කිරීමේ දඬුවමකට යටත් වී ඇත්නම්;

(ඊ) මේ පනතේ විධිවිධාන සලසා ඇති ආකාරයට ස්වකීය කාර්යන් සිදු කරගෙන යාමට අපොහොසත් වී ඇත්නම්; හෝ

(උ) නිසි අධිකරණ බලයක් යටතේ බුන්වත් හෝ බංකොලොත් බවට ප්‍රකාශ කර ඇති සහ නිදහස් නොකළ බුන්වත්කරුවකු හෝ බංකොලොත් තැනැත්තකු බවට පත්ව ඇත්නම්,

එවැනි තැනැත්තකු පර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරය හෝ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරය සඳහා පත් කරනු ලැබීමට හෝ අඛණ්ඩව එම ධුරයෙහි කටයුතු කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

නුසුදුසුකම තිබෙනු ඇතැයි කියාපාන විට ක්‍රියාපටිපාටිය

**17.** (1) පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරයට හෝ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ධුරයට පත් කරන ලද තැනැත්තකු ස්වකීය ධුර කාලය තුළ දී නුසුදුස්සකු ලෙස පත්ව ඇති බවට පැමිණිල්ලක් ලැබීමෙන් පසු හෝ එසේ විශ්වාස කිරීමට පාර්ලිමේන්තු මහ ලේකම්වරයාට හේතු ඇති අවස්ථාවක, පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින්, එම පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(2) පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින්, (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීමේ පිටපත් ජනාධිපතිවරයා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) එකී පිටපත ලැබීමෙන් පසු, ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත, එකී පරීක්ෂණය ප්‍රකාර තීරණයක් ගනු ලබන තෙක් පත්ව තිබෙනු ඇතැයි කියනු ලබන නුසුදුසුකම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එකී තැනැත්තාගේ සේවය වහාම අත්හිටුවනු ලැබිය යුතු ය.

(4) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් නුසුදුස්සකු වීමට පදනමක් ඇති බවට තීරණය කොට නිර්දේශ කරනු ලැබුවහොත් පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් ඒ බව ජනාධිපතිවරයා වෙත සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත, ඒ සඳහා හේතු දැක්වීමෙන් පසු පාර්ලිමේන්තු අයවැය නිලධරයා හෝ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා එකී ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(5) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් නුසුදුස්සකු වීමට පදනමක් නැති බවට තීරණය කරනු ලැබුවහොත්, පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් ඒ බව ජනාධිපතිවරයා වෙත සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර ජනාධිපතිවරයා විසින් (3) වන උපවගන්තිය යටතේ කරන ලද සේවය අත්හිටුවීම අවලංගු කරනු ලැබිය යුතු ය.

ධුරයෙන් ඉල්ලා අස්වීම

**18.** පාර්ලිමේන්තු අයවැය නිලධරයා හෝ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, ජනාධිපතිවරයා වෙත අමතන ලද ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එවැනි ඉල්ලා අස්වීමක් ලිපියේ නිශ්චිතව දක්වා ඇති දින සිට හෝ එලෙස දිනයක් නිශ්චිතව දක්වා නොමැති නම්, එම ලිපිය ජනාධිපතිවරයා වෙත ලැබුණු දින සිට බලාත්මක විය යුතු ය.

ධුර කාලය ඉකුත් වීම, මරණය, ඉවත් කිරීම හෝ ඉල්ලා අස්වීම මත වන පුරප්පාඩුව පිරවීම

**19.** (1) පාර්ලිමේන්තු අයවැය නිලධරයා හෝ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ මරණය, ඉවත් කිරීම, ඉල්ලා අස්වීම හෝ ධුර කාලය ඉකුත් වීම හේතුවෙන් ධුරයේ යම් පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක, පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් 14 වන වගන්තිය ප්‍රකාරව අදාළ ධුරයන් සඳහා නැවත ඉල්ලුම්පත් කැඳවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව පත් කරනු ලබන තැනැත්තකු අවුරුදු පහක කාලපරිච්ඡේදයක් සඳහා පත් කරනු ලැබිය යුතු ය.

තාවකාලිකව බැහැරව සිටීම

**20.** (1) අයහපත් සෞඛ්‍ය තත්ත්වය, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා, පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් ස්වකීය ධුරයේ කාර්යන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, පාර්ලිමේන්තු අයවැය නිලධරයාට ස්වකීය කාර්යන් ඉටු කිරීමට හැකි වන තෙක් නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් එම තනතුරෙහි කටයුතු කරනු ලැබිය හැකි ය.

(2) අයහපත් සෞඛ්‍ය තත්ත්වය, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් ස්වකීය ධුරයේ කාර්යන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාට ස්වකීය කාර්යන් ඉටු කිරීමට හැකි වන තෙක් පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් 10 වන සහ 16 වන වගන්ති සැලකිල්ලට ගනිමින් එම තනතුරෙහි කටයුතු කරනු ලැබීමට තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

පාරිශ්‍රමික

**21.** පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ සහ නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ වැටුප් සහ වෙනත් පාරිශ්‍රමික පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලැබිය යුතු ය. එකී වැටුප් සහ වෙනත් පාරිශ්‍රමික ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු අතර ඔවුන්ගේ ධුර කාලසීමාව තුළ ඒවා අඩු නොකළ යුතු ය.

## III වන කොටස

### පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ මෙහෙයුම් කටයුතු

**22.** පාර්ලිමේන්තු අයවැය නිලධරයා වෙත- පාර්ලිමේන්තු අයවැය කාර්යාලය මෙහෙයවීමට හා කළමනාකරණය කිරීමට බලතල, කාර්ය සහ කර්තව්‍ය

(අ) 45 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා නිලධරයන් සහ සේවානියුක්තයන් බඳවා ගැනීමට සහ පත් කිරීමට;

(ආ) 45 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට අනුකූලව පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ නිලධරයන් සහ සේවානියුක්තයන්ගේ විනය කටයුතු පිළිබඳව කටයුතු කිරීමට සහ සේවයෙන් පහ කිරීමට;

(ඇ) පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ වැටුප් සහ වෙනත් පාරිශ්‍රමික පිළිබඳව තීරණය කිරීමට;

(ඈ) පනත යටතේ ස්වකීය වගකීම් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තු අයවැය කාර්යාලයට සහාය වීම සඳහා රජයේ අයවැයකරණය, මුදල් ප්‍රතිපත්තිය, මූල්‍ය ප්‍රතිපත්තිය, ක්ෂුද්‍ර ආර්ථික විශ්ලේෂණය හෝ වෙනත් අදාළ විශේෂඥ ක්ෂේත්‍රයක් පිළිබඳ දැනුම සහ පළපුරුද්ද ඇති යම් තැනැත්තකුගේ සේවාවන් ලබා ගැනීමට;

(ඉ) පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ මෙහෙයුම් කටයුතු සඳහා සහාය වීම සඳහා හෝ පාර්ලිමේන්තු අයවැය කාර්යාලයට මේ පනත යටතේ ස්වකීය වගකීම් ඉටු කිරීමට සහාය වීම සඳහා යම් තැනැත්තකු සමඟ ගිවිසුම්වලට ඇතුළත් වීමට;

(ඊ) පාර්ලිමේන්තු අයවැය කාර්යාලයට ලේකම්වරයකු පත් කිරීමට;

(උ) 29 වන වගන්තිය යටතේ සිදු කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් යම් රාජ්‍ය ආයතනයක් සන්තකයේ තබාගෙන ඇති යම් ලිඛිත හෝ විද්‍යුත් වාර්තාවක්,

දත්ත, විශ්ලේෂණ, ආකෘති නිර්මාණ හෝ වෙනත් තොරතුරු වෙනස් කළ හැකි ආකෘති මගින් කාලීනව පරීක්ෂා කිරීම සහ ඩිජිටල් හුවමාරු කිරීම සඳහා ප්‍රවේශය ඉල්ලා සිටීම සහ වැඩපිළිවෙළක් සැලසීමට;

(ඌ) රාජ්‍ය ආයතන විසින් සකස් කර රජය විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද අයවැය සහ වෙනත් මූල්‍ය යෝජනා සඳහා පාදක වූ ක්‍රමවේදය සහ උපකල්පන ඉල්ලා සිටීමට;

(එ) යෝග්‍ය විය හැකි පරිදි යම් වේලාවක් සහ කාලසීමාවක් තුළ පාර්ලිමේන්තු අයවැය කාර්යාලය වෙත අයවැයකරණ සහ පිරිවැයකරණ දත්ත ස්වයංක්‍රීයව සම්ප්‍රේෂණය වීම සඳහා රාජ්‍ය ආයතන සමඟ වැඩපිළිවෙළකට එළඹීමට;

(ඒ) මේ පනත යටතේ රීති සාදනු ලැබීමට බලය දෙන ලද හෝ නියම කරන ලද සියලු කාරණා සම්බන්ධයෙන් රීති සෑදීමට; සහ

(ඔ) සාමාන්‍යයෙන්, පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ අරමුණු ඉටු කිරීම හෝ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික හෝ යෝග්‍ය සියලු ක්‍රියා සහ දේ කිරීමට,

බලතල තිබිය යුතු ය.

පාර්ලිමේන්තු අයවැය කාර්යාලය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම

**23.** (1) පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, කාරක සභාවක්, 15 වන වගන්තියේ සඳහන් උපදේශන කමිටුව සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ යම් අදාළ නිලධරයන් විමසා, එක් එක් මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තු අයවැය කාර්යාලයට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරනු ලැබිය යුතු ය.

(2) ක්‍රියාකාරී සැලැස්ම තුළ-

(අ) මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ ප්‍රමුඛතාවන්; සහ

(ආ) එම මුදල් වර්ෂය තුළ එම ප්‍රමුඛතා සපුරා ගැනීම සඳහා පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ සම්පත් වෙන් කිරීම සඳහා වන මූල පත්‍රය,

ඇතුළත් විය යුතු ය.

(3) එක් එක් මූල්‍ය වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම, අදාළ විය හැකි පරිදි අයවැය කැඳවීම් චක්‍රලේඛවල සඳහන් කර ඇති කාලසීමාවට අනුකූලව සකස් කරනු ලැබිය යුතු ය.

(4) පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ පළමු ක්‍රියාකාරී සැලැස්ම, පාර්ලිමේන්තු අයවැය නිලධරයා පත් කළ දින සිට මාස තුනක් ඇතුළත සකස් කරනු ලැබිය යුතු ය.

බලතල පැවරීම

**24.** (1) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, මේ පනත මගින් ඔහු වෙත පවරන ලද හෝ නියම කරන ලද යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා හෝ පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු වෙත ලිඛිතව පවරනු ලැබිය හැකි ය. එම නිලධරයා සහ සේවානියුක්තයා විසින් පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ විධාන සහ පාලනයට යටත්ව එකී බලතලය, කාර්යය සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කළ යුතු ය.

(2) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද යම් බලතල පැවරීමක කුමක් සඳහන් වුව ද, එලෙස පවරන ලද බලතලය, කාර්යය සහ කර්තව්‍යය තනි තනිව ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හෝ කිරීමට හැකි වන අතර, එලෙස සිදු කිරීමේ දී යම් අවස්ථාවක එවැනි යම් බලතල පැවරීමක් අවලංගු කරනු ලැබිය හැකි ය.

නිසි බලධරයකු නම් කිරීම

**25.** පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ නිලධරයන් සහ සේවානියුක්තයන් අතරින් පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ විධානයන් පරිදි තොරතුරු සකස් කරනු ලබන තැනැත්තකු වීම සඳහා නිසි බලධරයකු නම් කරනු ලැබිය යුතු ය.

IV වන කොටස

## පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ ස්වාධීනත්වය සහ වගකිව යුතු බව

පාර්ලිමේන්තු අයවැය නිලධරයාගේ ස්වාධීනත්වය

**26.** (1) කිසිදු තැනැත්තකු විසින්, පාර්ලිමේන්තු අයවැය නිලධරයාට, නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයාට හෝ පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ යම් නිලධරයකුට හෝ සේවානියුක්තයකුට 15 වන වගන්තියේ සඳහන් උපදේශන කමිටුවේ යම් සාමාජිකයකුට, 29 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) වන ඡේදයේ සඳහන් යම් කමිටුවක සාමාජිකයකුට හෝ පාර්ලිමේන්තු අයවැය කාර්යාලය වෙත යම් සේවාවක් සපයන යම් තැනැත්තකු වෙත ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී යම් අයුතු බලපෑමක් හෝ පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ කටයුතු සඳහා අයුතු ලෙස මැදිහත් වීමක් සිදුනොකළ යුතු ය.

(2) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්-

(අ) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය අරමුණුවලට අනුකූලව, විනිවිදභාවයෙන් යුක්තව සහ අපක්ෂපාතීව ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම; සහ

(ආ) මේ පනත යටතේ නියම කර ඇති පරිදි යම් රාජ්‍ය ආයතනයක් සමඟ ඇතුළත් වූ සියලු ගිවිසුම් සහ වෙනත් එවැනි නියම කිරීම්, සොයා ගැනීම් සහ පිරිවැයකරණ ප්‍රතිපත්ති මහජනතාව වෙත අනාවරණය කිරීම,

කරනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුව වෙත වගකිව යුතු බව

**27.** (1) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, පාර්ලිමේන්තුව මගින් නියම කර ඇති පරිදි, පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ පාර්ලිමේන්තුව වෙත තොරතුරු සපයනු ලැබිය යුතු ය.

(2) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, එහි මුදල් වර්ෂය ආරම්භ වී මාස හතරක් ඇතුළත රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතු පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ මෙහෙයුම් කටයුතු සහ පරිපාලනය පිළිබඳ වාර්ෂික වාර්තාවක් සකස් කරනු ලැබිය යුතු ය.

(3) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින්-

(අ) පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ වාර්ෂික වාර්තාව සමාලෝචනය කළ යුතු ය;

(ආ) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් 23 වන වගන්තිය ප්‍රකාරව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව වියදම් ඇස්තමේන්තු කෙටුම්පතෙහි සාධාරණත්වය තක්සේරු කළ යුතු ය;

(ඇ) පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ අරමුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ මෙහෙයුම් කටයුතු සහ සම්පත් ලැබෙන මූලාශ්‍ර පිළිබඳ සලකා බැලිය යුතු ය; සහ

(ඈ) මේ පනත යටතේ පාර්ලිමේන්තු අයවැය කාර්යාලයට එහි වගකීම් ඉටු කිරීම සඳහා ඇති හැකියාව මත බලපෑමක් ඇති කරනු ලබන පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් වන යම් කරුණක් පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු ය.

පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ ස්වාධීන සමාලෝචනය

**28.** (1) යම් මැතිවරණයක් අවසන් වීමෙන් පසුව, පාර්ලිමේන්තුව විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව පිහිටුවා දින දාහතරක් ඇතුළත පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් ආරම්භ කරන ලෙස එකී රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තු අයවැය නිලධරයා වෙත නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන නියමයක් තුළ-

(අ) සමාලෝචනය පැවැත්වීම සඳහා උචිත තැනැත්තා හෝ ආයතනය;

(ආ) සමාලෝචනයේ විෂය පථය;

(ඇ) සමාලෝචනය පැවැත්විය යුතු ආකාරය; සහ

(ඈ) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු සමාලෝචන වාර්තාවේ ඇතුළත් විය යුතු කරුණු,

ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(3) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ස්වාධීන සමාලෝචනයක් සිදු කිරීමට ඉල්ලීමක් කරන ලද දිනයේ සිට මාස නවයක් ඇතුළත එම සමාලෝචනය සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

(4) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින්, එම වාර්තාව ලැබුණු පසු ප්‍රායෝගිකව හැකි ඉක්මනින් එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් මීට අවුරුදු පහක් ඇතුළත ස්වාධීන සමාලෝචනයක් සඳහා ඉල්ලීමක් කර නොමැති නම්, පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිට සිටින යම් පුද්ගලයකුගෙන් (වෙනත් අධිකරණ බල ප්‍රදේශ තුළ පිහිටි සමාන ආයතන හෝ ජාත්‍යන්තර සංවිධාන ඇතුළත්ව) පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ කාර්ය සාධනය පිළිබඳ ස්වාධීන බාහිර සමාලෝචනයක් හෝ සම-සමාලෝචනයක් පැවැත්වීම සඳහා ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

## නිරවද්‍යභාවය සහ විනිවිදභාවය සඳහා පහසුකම් සැලසීම සඳහා වූ විධිවිධාන

පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ විශ්ලේෂී කර්තව්‍ය

**29.** (1) පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින් කාරක සභා හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හෝ පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම්වල ඉල්ලීම් සඳහා, හෝ සාමාන්‍යයෙන්

පළකරනු ලබන එහි විශ්ලේෂණයන්හි කොටසක් වශයෙන්, පහත දැක්වෙන විශ්ලේෂී කර්තව්‍ය කරනු ලැබිය යුතු යː-

(අ) දිගු කාලීන මූල්‍ය තිරසරභාවය, ණය තිරසරභාවය පිළිබඳ විශ්ලේෂණ ඇතුළුව මූල්‍ය රීති සහ ඉලක්ක සමග අනුකූල වන ආර්ථික හා මූල්‍ය පුරෝකථන සහ ප්‍රක්ෂේපණ සිදු කිරීම සහ උපායමාර්ගික ඉලක්කවලට එරෙහි අයවැයකරණ ක්‍රියාමාර්ග නිරීක්ෂණය කිරීම;

(ආ) රජය විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්ෂික සහ පරිපූරක අයවැය යෝජනා පිළිබඳ සාමාන්‍ය විශ්ලේෂණය;

(ඇ) කාරක සභා සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් නිශ්චිත අයවැය විශ්ලේෂණ;

(ඈ) රජය විසින් සභාගත කරන ලද හෝ පාර්ලිමේන්තුව විසින් සකස් කරන ලද ව්‍යවස්ථාවන් සහ ප්‍රතිපත්ති යෝජනා පිළිබඳ පිරිවැයකරණය විශ්ලේෂණ;

(ඉ) පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසු සහ මැතිවරණ වලට පෙර පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක ප්‍රතිපත්ති ප්‍රකාශනවල ඇතුළත් ප්‍රතිපත්ති සහ යෝජනාවල පිරිවැයකරණ; සහ

(ඊ) පාර්ලිමේන්තුවට එහි රාජ්‍ය මූල්‍ය වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රතිලාභ සැලසීම අරමුණු කොටගෙන පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් සිය අභිමතය පරිදි සිදු කරනු ලබන සාමාන්‍ය විශ්ලේෂණාත්මක අධ්‍යයන.

(2) (අ) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද නවතම ආර්ථික පුරෝකථන සීමා සහ මූල්‍ය ඇස්තමේන්තු පිළියෙල කිරීම;

(ආ) යෝජනා පදනම් කරගත් විශ්ලේෂණවල සත්‍යතාව පරීක්ෂා කිරීම සඳහා විකල්ප සම්මුති, උපකල්පන, පුරෝකථන සහ ඇස්තමේන්තු සම්මත කිරීම;

(ඇ) විශ්ලේෂී කර්තව්‍ය ඉටු කිරීම සඳහා භාවිත කරනු ලැබිය හැකි ස්වාධීන දත්ත කට්ටල සහ ආකෘති පරීක්ෂණය කිරීම; හෝ

(ඈ) විශ්ලේෂණය කිරීම සඳහා විවිධ ප්‍රවේශයන් හැඩගැස්වීම සඳහා උපකාර කිරීමට යම් කමිටු පිහිටුවීම හෝ පාර්ලිමේන්තුව වෙත සපයන ලද විශ්ලේෂණයේ ප්‍රබලතාව පරීක්ෂා කිරීම සඳහා යම් සම-සමාලෝචන මණ්ඩල පිහිටුවීම,

ඇතුළුව, (1) වන උපවගන්තියේ දක්වා ඇති කර්තව්‍ය ඉටු කිරීමේ ප්‍රවේශය නිශ්චය කිරීමේ දී පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින් ගත යුතු ක්‍රමවේදී ස්වාධීනත්වයක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

තොරතුරු සඳහා ප්‍රවේශ වීම

**30.** (1) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, 29 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති විශ්ලේෂී කර්තව්‍ය සිදු කිරීම සඳහා භාවිත කිරීමට පාර්ලිමේන්තු අයවැය කාර්යාලයට අවශ්‍ය වන රාජ්‍ය ආයතන සතු පෞද්ගලික සහ සංවේදී තොරතුරුවල ආරක්ෂාව සම්බන්ධයෙන්, යෝග්‍ය ආරක්ෂක විධිවිධාන යොදාගනු ලැබිය යුතු ය.

(2) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, අනාවරණය කිරීම මගින් ජාතික ආරක්ෂාවට අගතිගාමී වන ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සම්බන්ධ යම් තොරතුරක් 29 වන වගන්තිය අනුව සිදු කරන ලද පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ කර්තව්‍ය විශ්ලේෂණය සඳහා තීරණාත්මක සාධකයක් වන්නේ ද යන්න තීරණය කිරීම සඳහා එම තොරතුරු සතු අදාළ දෙපාර්තමේන්තුව, නියෝජ්‍ය ආයතනය හෝ සංවිධානය සඳහා වගකිව යුතු අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පෞද්ගලිකව විභාග කරනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය ආයතනය විසින්, ජාතික ආරක්ෂාව සම්බන්ධ තොරතුරු හැර එකී තොරතුරු පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් නියම කරනු ලබන යම් ආකාරයට සහ යම් දිනයක දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් නිශ්චිතව සඳහන් කරන ලද කාලසීමාව ඇතුළත එකී තොරතුරු ඉදිරිපත් කිරීමට නොහැකි බවට යම් රාජ්‍ය ආයතනයක් විසින් ඇස්තමේන්තු කරනු ලබන්නේ නම්, එකී රාජ්‍ය ආයතනය විසින් තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා විකල්ප දිනයක් ලිඛිතව පාර්ලිමේන්තු අයවැය නිලධරයා වෙත යෝජනා කරනු ලැබිය හැකි ය. තොරතුරු ඉදිරිපත් කළ යුතු දිනය වෙනස් කරන්නේ ද යන්න පිළිබඳ අභිමතය පාර්ලිමේන්තු අයවැය නිලධරයා සතු විය යුතු ය.

(5) යම් රාජ්‍ය ආයතනයක් විසින් ඉල්ලීමෙහි නිශ්චිතව දක්වන ලද දින හෝ ප්‍රතිශෝධිත දින එම තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක, පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, (383 වන අධිකාරය වූ) පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතට අනුකූලව එකී තොරතුරු සඳහා වන ඉල්ලීමක් එම රාජ්‍ය ආයතනය වෙත නැවත නිකුත් කරන ලෙස කථානායකවරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(6) රාජ්‍ය ආයතනයක සෑම නිලධරයකු ම සහ සේවානියුක්තයකු ම මේ වගන්තියේ විධිවිධාන සමඟ අනුකූල විය යුතු අතර, එවැනි අනුකූල වීමක් එම රාජ්‍ය ආයතනය සතු සහ කළමනාකරණය කරනු ලබන තොරතුරක විශ්වසනීයභාවය, රහසිගතභාවය හෝ අනාවරණය නොකිරීමට අදාළ යම් ලිඛිත නීතියක්, නියෝගයක්, එකඟතාවක් හෝ කාර්ය පටිපාටියක් උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

**31.** (1) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, මේ පනතේ විධිවිධානයන්ට යටත් ව, (2) වන උපවගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇති තොරතුරු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මගින් විද්‍යුත් හෝ ඩිජිටල් මාධ්‍ය සහ ගැසට් පත්‍රයේ පළ කිරීම මගින් මහජනතාව වෙත ලබා දීම පිළිබඳ සහතික විය යුතු ය. විනිවිදභාවය

(2) (1) වන උපවගන්තියේ සඳහන් තොරතුරු සඳහා-

(අ) මේ පනත යටතේ සාදනු ලැබීමට, නිකුත් කරනු ලැබීමට හෝ පළ කරනු ලැබීමට අවශ්‍ය යම් රීතියක්, මූලධර්මයක් හෝ මාර්ගෝපදේශයක්;

(ආ) වාර්ෂික අයවැයකරණ ක්‍රියාවලියට සමගාමීව ක්‍රමවත්ව වාර්තා නිකුත් කිරීමට යෝජිත දිනයන්;

(ඇ) 30 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පාදක කරගත් දත්ත පිළිබඳ පූර්ණ වාර්තාවක් ඇතුළුව, පාර්ලිමේන්තු අයවැය කාර්යාල ක්‍රමවත් වාර්තා සහ විශ්ලේෂණ, ඒ විශ්ලේෂණ සකස් කිරීමේ දී භාවිත කරන ලද උපකල්පන සහ ක්‍රමවේදය;

(ඈ) කාරක සභාවක හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ නිශ්චිත ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් 30 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පාදක කරගත් දත්ත පිළිබඳ පූර්ණ වාර්තාවක් ඇතුළුව පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින් සකස් කරන ලද වාර්තා සහ විශ්ලේෂණ, විශ්ලේෂණ සකස් කිරීමේ දී භාවිත කරන ලද උපකල්පන සහ ක්‍රමවේදය;

(ඉ) භාවිත කරන ලද දත්ත, උපකල්පන සහ ක්‍රමවේදය පිළිබඳ පූර්ණ වාර්තාවක් ඇතුළුව පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිරිවැයකරණ විශ්ලේෂණ;

(ඊ) පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(උ) 23 වන වගන්තිය යටතේ සකස් කරන ලද එක් එක් මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ ක්‍රියාකාරී සැලැස්ම,

ඇතුළත් විය යුතු ය.

**32.** මේ පනතේ විධිවිධාන සමඟ සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අදාළ විය යුතු ය.

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අදාළ විය යුතු බව

VI වන කොටස

**පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ සහාය ලබා ගැනීමේ කාර්ය පටිපාටිය**

**33.** (1) යම් කාරක සභාවක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් 29 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති විශ්ලේෂණයක් පිළියෙල කරන ලෙස පාර්ලිමේන්තු අයවැය කාර්යාලයෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

පාර්ලිමේන්තු අයවැය කාර්යාලයෙන් විශ්ලේෂණයක් ඉල්ලීම සඳහා වන මාර්ගෝපදේශ

(2) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්–

(අ) විශ්ලේෂණයක් සිදු කරන ලෙස පාර්ලිමේන්තු අයවැය කාර්යාලයෙන් විධිමත් ලෙස ඉල්ලීමක් කිරීමට කාරක සභා සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන ක්‍රියාවලිය;

(ආ) එකී ලිඛිත ඉල්ලීම් සඳහා වන ආකෘතිය;

(ඇ) ලිඛිත ඉල්ලීමෙහි ඇතුළත් කරනු ලැබිය යුතු තොරතුරු;

(ඈ) ලිඛිත ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබිය හැකි ආකාරය; සහ

(ඉ) ඉල්ලීම්වලට ප්‍රමුඛතාව ලබා දීමට පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින් භාවිත කළ යුතු ක්‍රමවේදය,

දක්වමින් රීති සෑදීම සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම කරනු ලැබිය යුතු ය.

(3) පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින්–

(අ) පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට පෙර පාර්ලිමේන්තුව නියෝජනය කරන පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නායකයා විසින්, එහි ප්‍රතිපත්ති

ප්‍රකාශනය පිළිබඳ පිරිවැයකරණය විශ්ලේෂණයක් සිදු කරන ලෙසට පාර්ලිමේන්තු අයවැය කාර්යාලයෙන් විධිමත්ව ඉල්ලීමක් කිරීම සඳහා වන ක්‍රියාවලිය;

(ආ) පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුව සහ මැතිවරණ දිනයට පෙර, මැතිවරණයකට තරඟ කරන පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නායකයා විසින්, එහි ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබඳ පිරිවැයකරණ විශ්ලේෂණයක් සිදු කරන ලෙසට පාර්ලිමේන්තු අයවැය කාර්යාලයෙන් විධිමත්ව ඉල්ලීමක් කිරීම සඳහා වන ක්‍රියාවලිය;

(ඇ) එකී ලිඛිත ඉල්ලීම් සඳහා වන ආකෘතිය;

(ඈ) ලිඛිත ඉල්ලීමෙහි ඇතුළත් කරනු ලැබිය යුතු තොරතුරු;

(ඉ) ලිඛිත ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබිය හැකි ආකාරය; සහ

(ඊ) ඉල්ලීම්වලට ප්‍රමුඛතාව ලබා දීමට පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින් භාවිත කරන ක්‍රමවේදය,

දක්වමින් රීති සෑදීම සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම කරනු ලැබිය යුතු ය.

(4) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, (2) වන සහ (3) වන උපවගන්තිවල දක්වා ඇති රීති සහ මාර්ගෝපදේශ මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසු මාස හයක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒවා සුදුසුතම ජාත්‍යන්තර පරිචය සමඟ අනුකූලව නිතිපතා සමාලෝචනය කර යාවත්කාලීන කරනු ලැබිය යුතු ය.

ප්‍රතිපත්ති පිරිවැය කිරීමක් පිළියෙල කරන ලෙසට පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් වන ඉල්ලීමක්

**34.** (1) පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට පෙර, පාර්ලිමේන්තුව නියෝජනය කරන පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නායකයකු විසින්, එහි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇති ප්‍රතිපත්තිවල පිරිවැයකරණයක් පිළියෙල කරන ලෙසට පාර්ලිමේන්තු අයවැය කාර්යාලයෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුව, මැතිවරණයට තරඟ කරන පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නායකයකු විසින්, පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් සාදන ලද යම් රීතිවලට අනුකූලව, එහි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පළ කරන ලද යෝජනාවක් පිළිබඳ ප්‍රතිපත්ති පිරිවැයකරණයක් පිළියෙල කරන ලෙසට පාර්ලිමේන්තු අයවැය කාර්යාලයෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(3) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් ඉල්ලීම ලැබීමෙන් පසුව, හැකි තාක් ඉක්මනින් ප්‍රතිපත්ති පිරිවැය කරණය කළ යුතු අතර, එකී ඉල්ලීම සහ ප්‍රතිපත්ති පිරිවැයකරණය මහජනතාව වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) මැතිවරණ දිනයට පෙර (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් සිදු කරනු ලබන ප්‍රතිපත්ති පිරිවැය කිරීමක් මහජනතාව වෙත නිකුත් කිරීමට පාර්ලිමේන්තු අයවැය නිලධරයාට නොහැකි වන අවස්ථාවක ඔහු විසින් ඒ සඳහා වන හේතු දක්වමින් ප්‍රකාශයක් මහජනතාව වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ සඳහන් කරන ලද ප්‍රකාශය, පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, මැතිවරණ දිනයට පසුව හැකිතාක් ඉක්මනින් නිකුත් කරනු ලැබිය යුතු ය.

සහාය ලබා දීමට නොහැකි වීම සඳහා හේතු

**35.** (1) පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට පෙරාතුව ම හෝ මැතිවරණ දිනයට පෙරාතුව ම, 33 වන වගන්තිය යටතේ කරන ලද යම් ඉල්ලීමක් මත ප්‍රතිපත්තියක හෝ යෝජිත ප්‍රතිපත්තියක පිරිවැය කිරීමක් පිළියෙල කිරීමට පාර්ලිමේන්තු අයවැය නිලධරයාට නොහැකි වන අවස්ථාවක ප්‍රතිපත්තියක හෝ යෝජිත ප්‍රතිපත්තියක එකී පිරිවැයකරණය පිළියෙල කිරීමට පාර්ලිමේන්තු අයවැය නිලධරයාට–

(අ) අවශ්‍ය තොරතුරු ලැබී නොමැති නම්; හෝ

(ආ) ප්‍රමාණවත් කාලයක් නොතිබුණි නම්,

පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද දින හෝ මැතිවරණ දින සිට බලාත්මක වන පරිදි එකී ඉල්ලීම ඉල්ලා අස්කර ගනු ලැබූ සේ සලකනු ලැබිය යුතු ය.

(2) 33 වන වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් ඕනෑම අවස්ථාවක දී, ඉල්ලීම කරන ලද නායකයා විසින් පාර්ලිමේන්තු අයවැය නිලධරයා අමතා ලිඛිතව ඉල්ලා අස් කරගනු ලැබිය හැකි ය.

මැතිවරණ පොරොන්දු පිළිබඳ පශ්චාත් මැතිවරණ වාර්තාව

**36.** (1) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, පාර්ලිමේන්තුව වෙත තේරී පත් වුණු යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් කරන ලද සහ පාර්ලිමේන්තුව වෙත තේරී පත් වුණු එකී පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල ඇතුළත් කරන ලද මැතිවරණ යෝජනාවල රාජ්‍ය මූල්‍ය සහ මූල්‍යමය බලපෑම පිළිබඳ පශ්චාත්-මැතිවරණ වාර්තාවක් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) මැතිවරණයකට පෙරාතුව ම පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින් සකස් කර ප්‍රසිද්ධ කරන ලද පිරිවැයකරණ සඳහා වන ඉල්ලීම් සඳහා (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන අදාළ නොවිය යුතු ය.

## VII වන කොටස

## මුදල්

පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ වියදම් ඇස්තමේන්තු කෙටුම්පත

**37.** (1) මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අයවැය කැඳවීමේ චක්‍රලේඛයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ අයවැය පිළියෙල කිරීමේ මාර්ගෝපදේශවලට අනුකූලව, එම මුදල් වර්ෂය සම්බන්ධයෙන් වූ වියදම් ඇස්තමේන්තු කෙටුම්පත රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ක්‍රියාකාරී සැලසුම මත පදනම්ව වියදම් ඇස්තමේන්තු කෙටුම්පතේ සාධාරණත්වය තක්සේරු කර මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අයවැය කැඳවීමේ චක්‍රලේඛයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ අයවැය පිළියෙල කිරීමේ මාර්ගෝපදේශවලට අනුකූලව, ඒ පිළිබඳව පාර්ලිමේන්තු අයවැය නිලධරයා වෙත සහ පාර්ලිමේන්තුව වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(3) පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අයවැය කැඳවීමේ චක්‍රලේඛයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ අයවැය පිළියෙල කිරීමේ මාර්ගෝපදේශවලට අනුකූලව වියදම් ඇස්තමේන්තු කෙටුම්පත අයවැයට ඇතුළත් කිරීම පිණිස මුදල් විෂය පවරා ඇත්තා වූ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ අරමුදල

**38.** (1) පාර්ලිමේන්තු අයවැය කාර්යාලයට එහිම අරමුදලක් තිබිය යුත්තේ ය.

(2) එම අරමුදල වෙත පහත දැක්වෙන මුදල් ගෙවනු ලැබිය යුතු ය. එනම්–

(අ) පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල්; සහ

(ආ) ඕනෑම ආකාරයක මූලාශ්‍රයකින් පරිත්‍යාග, ත්‍යාග සහ ප්‍රදාන වශයෙන් පාර්ලිමේන්තු අයවැය කාර්යාලය වෙත ලැබිය හැකි සියලු මුදල්:

එසේ වුව ද, පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින්, පාර්ලිමේන්තු අයවැය කාර්යාලයට ලැබෙන හෝ ලබා දෙන සියලු පරිත්‍යාග, ත්‍යාග සහ ප්‍රදාන සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගනු ලැබිය යුතු ය.

(3) පහත දැක්වෙන මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. එනම්–

(අ) පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින් දරනු ලබන වියදම් පියවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු මුදල්;

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ වූ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී පාර්ලිමේන්තු අයවැය නිලධරයා, නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා සහ පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ නිලධරයන් සහ සේවානියුක්තයන් විසින් දරන ලද වියදම් පියවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු මුදල්; සහ

(ඇ) මේ පනත යටතේ වන අරමුදලින් ගෙවනු ලැබිය යුතු බවට නියම කරනු ලැබිය හැකි සියලු මුදල්.

පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින් ගිණුම් පවත්වාගෙන යා යුතු බව

**39.** පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින්, උචිත බවට සලකනු ලැබිය හැකි පරිදි, යම් බැංකුවක් සමඟ ගිණුම් විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි අතර, රාජ්‍ය සංස්ථාවල මූල්‍ය ගනුදෙනුවලට අදාළ රජයේ බලපවත්නා මුදල් නියෝග ප්‍රකාරව එම ගිණුම් මෙහෙයවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය

**40.** (1) පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින් ස්වකීය ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් මෙන්ම වෙනත් මූල්‍ය ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ මූල්‍ය කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ මතයන් ඉදිරිපත් කිරීමේ කාර්ය සඳහා 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත යටතේ හෝ බලාත්මකව පවතින වෙනත් යම් අදාළ ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් අනුගමනය කරනු ලබන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින් ස්වකීය ගිණුම් සකස් කරනු ලැබිය යුතු ය.

(4) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ අන්තර්ගත විධිවිධාන පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු ය.

## VIII වන කොටස

### සාමාන්‍ය

සද්භාවයෙන් කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් වූ මුක්තිය

**41.** (1) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටුකිරීමේ දී හෝ කිරීමේ දී තමා විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලද ලෙස උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ සිදුකරන ලද යම් මගහැරීමක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අයවැය නිලධරයා, නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා, පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ නිලධරයන් සහ සේවානියුක්තයන් වගකියනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් මුක්තිය-

(අ) තත්කාලයේ දී බලපවත්වන යම් ලිඛිත නීතියක් යටතේ වූ අපරාධ වරදක් පිළිබඳ වගකීම සඳහා; සහ

(ආ) මේ පනතේ හෝ වෙනත් යම් අදාළ ලිඛිත නීතියක සඳහන් විධිවිධාන උල්ලංඝනය කරමින් සිදුකරනු ලබන යම් ක්‍රියාවක් සඳහා,

දීර්ඝ කරනු නොලැබිය යුතු ය.

**42.** පාර්ලිමේන්තු අයවැය කාර්යාලය (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තු අයවැය කාර්යාලය උපලේඛනගත ආයතනයක් විය යුතු බව

**43.** පාර්ලිමේන්තු අයවැය නිලධරයා, නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා, පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ නිලධරයන් සහ සේවානියුක්තයන් (19 වන අධිකාරය වූ) දණ්ඩනීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තු අයවැය නිලධරයා, නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා ආදිය රජයේ සේවකයන් විය යුතු බව

**44.** (1) යම් අධිකරණයක් ඉදිරිපිට දී පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින් හෝ පාර්ලිමේන්තු අයවැය කාර්යාලයට එරෙහිව ගෙන එනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී පාර්ලිමේන්තු අයවැය කාර්යාලය විසින් දරන ලද සියලු වියදම් පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී පාර්ලිමේන්තු අයවැය කාර්යාලය වෙත ගෙවන ලද හෝ එම කාර්යාලය විසින් ප්‍රතිපූර්ණය කරනු ලබන පිරිවැය පමණක් පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ අරමුදල වෙත බැරකරනු ලැබිය යුතු ය.

සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල වියදම් පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු බව

(2) පාර්ලිමේන්තු අයවැය නිලධරයා, නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා, පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් මේ පනත යටතේ කරන ලද හෝ කරනු ලැබූ බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට දී එම තැනැත්තාට එරෙහිව ගෙන එනු ලබන යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී එම ක්‍රියාව එම තැනැත්තා විසින් සද්භාවයෙන් සිදුකර ඇති බවට අධිකරණය තීරණය කරන්නේ නම්, පාර්ලිමේන්තු අයවැය නිලධරයා, නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා, පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ යම් නිලධරයකු හෝ සේවානියුක්තකයකු විසින් දරන ලද යම් වියදමක්, එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී තමා විසින් දරන ලද එම වියදම ප්‍රතිපූර්ණය කරගෙන නැත්නම් මිස පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු රීති

**45.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ වූ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රීති සාදනු ලැබිය යුතු බවට බලය පවරනු ලබන හෝ නියම කරනු ලබන සියලු කාරණා සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අයවැය නිලධරයා විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම පළකරන ලද දින සිට හෝ එකී රීති මගින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් පසු දිනයක සිට එම රීති බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම එසේ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දිනයෙන් පසුව, මාස තුනක් නොඉක්මවන කාලයක් ඇතුළත, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම රීතියක් ම එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක් සඳහා එමගින් අගතියක් නොවිය යුතු ය.

(4) එම අනනුමතයේ දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**46.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස–

"අයවැය ලේඛනය" යන්නට, අදාළ මූල්‍ය වර්ෂය සඳහා වන විසර්ජන පනත ද ඇතුළත් වේ;

"අයවැය කැඳවීමේ චක්‍රලේඛය" යන්නෙන්, අයවැය පිළියෙල කිරීමේ කාර්යයට අදාළ මුදල් වර්ෂය සඳහා රාජ්‍ය ආයතනයක ආදායම සහ වියදම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛයක් අදහස් වේ;

"කාරක සභා" යන්නෙන්, යම් පාර්ලිමේන්තු කාරක සභාවක් අදහස් වේ;

"රජයේ මුදල් පිළිබඳ කාරක සභාව" සහ "ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව" යන්නෙන්, ස්ථාවර නියෝග ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් පත් කරනු ලබන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සහ ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව අදහස් වේ;

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ වන ව්‍යවස්ථාවේ සඳහන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අදහස් වේ;

"පිරිවැයකරණය" යන්නෙන්, ක්‍රියාත්මක කරනු ලැබුවහොත් අයවැය අතිරික්තය හෝ අයවැය හිඟය වෙනස් විය හැකි හෝ පවත්නා නීතිවලට අදාළව රටෙහි පවතින සම්පත් සඳහා හොඳින්ම ගැළපෙන 4 වන වගන්තියේ හෝ පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පනත් කෙටුම්පතක සඳහන් ප්‍රතිපත්ති යෝජනාවක් පිළිබඳ තක්සේරුවක් අදහස් වන නමුත් -

(අ) එය ප්‍රතිපත්තියක යහගුණය තක්සේරු කිරීමක් නොවන අතර, එමගින් ප්‍රතිපත්තිමය නිර්දේශ ඉදිරිපත් නොකළ යුතු ය;

(ආ) එමගින් අයවැය ලේඛනය මත වූ බලපෑම හැර යම් ප්‍රතිපත්තියක හෝ පනත් කෙටුම්පතක යම් ආර්ථිකමය බලපෑම තක්සේරු කරනු නොලබයි; සහ

(ඇ) එමගින් යම් ප්‍රතිපත්තියක මූල්‍ය නොවන බලපෑම තක්සේරු කරනු නොලබයි,

තව ද, ඒ සඳහා-

(i) යෝජනාවේ සමස්ත පිරිවැය තක්සේරු කිරීමක්;

(ii) ප්‍රතිපත්තිමය පිරිවැයකරණය සකස් කිරීම සඳහා භාවිත කරනු ලබන ක්‍රමවේදය පිළිබඳ විස්තරයක්; සහ

(iii) විශ්ලේෂණ සඳහා භාවිත කරන ලද යෙදවුම්,

ඇතුළත් වේ;

"මැතිවරණ" යන්නෙන්, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ වූ යම් මැතිවරණයක් අදහස් වේ;

"ස්වාධීන කණ්ඩායම" යන්නෙන්, යම් පිළිගත් දේශපාලන පක්ෂයක් සමග අන්‍යාකාරයකින් අනුබද්ධ නොවන හෝ එවැනි පිළිගත් දේශපාලන පක්ෂයක සාමාජිකයකු නොවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, යම් මැතිවරණයක දී දේශපාලඥයන් හෝ අපේක්ෂකයන්ගෙන් සමන්විත කණ්ඩායමක් අදහස් වේ;

"තොරතුරු" යන්නට–

(අ) රාජ්‍ය ආයතනයක් විසින් සකස් කරනු ලබන මූල්‍ය, වාණිජ, තනිපුද්ගල හා වැඩසටහන් දත්ත;

(ආ) මූල්‍යමය ආකෘති සහ පිරිවැයකරණය ආකෘති; සහ

(ඇ) ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා තොරතුරු සහ පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති යම් ප්‍රතිපත්තියක් හෝ පනත් කෙටුම්පතක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා රජය විශ්වාසය තබනු ලබන යම් නෛතික උපදේශයක්,

ඇතුළත් වේ;

"ප්‍රතිපත්ති ප්‍රකාශනය" යන්නෙන්, යම් මැතිවරණයකට පෙරාතුව පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නිකුත් කරනු ලබන ප්‍රකාශයක් අදහස් වන අතර ඊට මැතිවරණ වේදිකාවක දී සිදු කරන ලද යම් ප්‍රකාශිත ප්‍රතිඥා ද ඇතුළත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එම යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"රාජ්‍ය ආයතනය" යන්නෙන්, යම් රජයේ අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, පළාත් පාලන ආයතනයක් සහ රජය හෝ යම් රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් කොටස්වලින් සියයට පනහකට වඩා වැඩි ප්‍රමාණයක් දරන්නා වූ ද 1987 අංක 22 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන රාජ්‍ය සංස්ථා බවට පරිවර්තනය කිරීමේ පනතේ අර්ථානුකූලව වූ යම් ව්‍යාපාරයක් හෝ වෙනත් යම් ව්‍යවසායක් හෝ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ ලියාපදිංචි කරන ලද බවට සලකන යම් සමාගමක් සහ යම් පළාත් සභාවක අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභාවක් විසින් පිහිටුවන ලද හෝ ඇති කරන ලද යම් අධිකාරියක් අදහස් වේ;

"රාජ්‍ය සම්පත්" යන්නෙන්, මුදල්, අරමුදල්, ඉඩම්, ගොඩනැගිලි, පහසුකම්, උපකරණ, සැපයුම් සහ වාහන ඇතුළත් වන අතර ඊට සීමා නොවන්නා වූ යම් රාජ්‍ය ආයතනයක් සතු යම් දේපළක් හෝ වත්කමක් අදහස් වේ; සහ

"පිළිගත් දේශපාලන පක්ෂය" යන්නට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එම යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

**47.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.